## 430 රෑ තරු බබළනවා

රෑ තරු බබළනවා
මල් පිපිලා වාගේ
එළියෙන් නැහැවෙනවා
මල් වැහැලා වාගේ

රැව් පිළි රැව් දෙනවා
ගීත නාද වාගේ ගීත නාද වාගේ
බිළිඳකු හිනැහෙනවා
මුහුදක රැළි වාගේ

සීත සුළං එනවා
උයනක සිරි වාගේ
ගොපලුන් දුර එනවා
පැණි බමරුන් වාගේ

බිළිඳකු හිනැහෙනවා
පොපියන කුසුම් වගේ
තුරුලක පෙරළෙනවා
හිම මත හිම වාගේ